2021



වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021



රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

නො.163, කිරුළපන මාවත,

පොල්හේන්ගොඩ,

කොළඹ 05

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 210

අන්තර්ගතය

	පටුන	පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 12
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13 - 19
පරිච්ඡේදය 03-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	20 - 40
පරිච්ඡේදය 04-	කාර්ය සාධන දර්ශක	41 - 46
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	47 - 51
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	52 - 54
පරිච්ඡේදය 07-	අනුකූලතා වාර්තාව	55 - 68
	අවසානය	69 - 70

01
පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ). ව්‍යාපෘතිය

ආ). දායක නියෝජිතායතනය

ඇ). ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි.

ඈ). ව්‍යාපෘති කාල සීමාව

1.1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලන සමයේ දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයේදී යුද තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “War Information Centre” නමින් ආයතනයක් ක්‍රියාත්මක විය.

ලෝක යුද්ධය නිමා වීමත් සමඟ යුද තොරතුරු මධ්‍යස්ථානය, රජයේ සංවර්ධන කාර්භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව” නමින් අලුත් ආයතනයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ පළමු වතාවට ස්ථාපනය කෙරිණ. ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය සහ
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය යන අංශ තුනෙන් සමන්විත විය.

රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්යයන් තුනක් මුල් කරගෙන, ප්‍රධාන අංශ තුනක් යටතේ ස්ථාපිත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ එම ප්‍රධාන කාර්යයන් බවට පත් වූයේ,

01. රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීම
02. රජයේ නිල ප්‍රකාශන ජනතාව අතරට ගෙන යාම (මුද්‍රණය හා බෙදා හැරීම)
03. රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය පිළිබඳව ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය විසින් වාර්තා චිත්‍රපට නිපදවා ප්‍රදර්ශනය කිරීම

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක්, එක් අංශ වරින්වර, තැනින් තැන ස්ථාපනය කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැගිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත - අතපත්තු ගොඩනැගිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට ගෙනැවිත් තිබේ. එතැන් සිට එම පරිශ්‍රයේ නව ගොඩනැගිලි ඉදිකරමින් ආයතනයේ විවිධ අංශ එකම පරිශ්‍රයකට ගෙන ඒමට ආයතන ප්‍රධානීන් කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මනා සේවයක් ඉටුකිරීම

සඳහා කාර්ය මණ්ඩලයට ලබා දෙන ත්‍යාගයක් ලෙස එම පරිශ්‍රයේම ආයතනයේ යටිතල පහසුකම් සවිමත් කරමින් ඉදිකරන ලද පස් මහළින් සැදි නව මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට 2012 මාර්තු 30 වැනිදා සුභ මොහොතින් ගෙවදින ලදි.

වර්තමානයේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ධුරය දක්වා ආයතන ප්‍රධානියාගේ තත්වය උසස් වී ඇති නමුත් ආරම්භයේදී එම තනතුර ප්‍රවෘත්ත්‍යාධිකාරී නම් විය. 1948 ආරම්භක ප්‍රවෘත්ත්‍යාධිකාරී වූයේ පී.නඩේශන් මහතාය. ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා ආයතන ප්‍රධානී තනතුර උසස් වී තිබේ.

මෙකී කාර්යභාරය ඉටු කිරීම සඳහා පළපුරුදු, දක්ෂ ජනමාධ්‍යවේදියෙකු මෙන්ම පුවත්පත් කතුවරයෙකු වූ එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. එසේම සහකාර ප්‍රවෘත්ති නිලධාරීන් ලෙස පී.එන්.මැද්දේගොඩ, එල්.ආර්.ගුණතිලක, එස්.පී.වෙත්තසිංහ, පී.බී.විජේසිංහ යන මහත්වරුන් කටයුතු කර තිබේ.

එවකට රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ධුරය හෙබවූ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම මහතාගේ සංකල්පයක් මත ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශනයක් වන ‘‘දෙසතිය’’ සඟරාවේ මංගල කලාපය 1978 පෙබරවාරි 4 වැනිදා එළි දුටුවේ ශ්‍රී ලාංකේය ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් ලෙසිනි. එය දිගු තිස්සේ තීරණාත්මක සන්ධිස්ථාන පසුකර අඛණ්ඩව ජන මනස පෝෂණය කරමින් සිටින මුද්‍රිත මාධ්‍යයකි.

‘‘සක්වල අතැඹුලක්’’ කළ දෙසතිය විසින් පෝෂණය වූ ලේඛක පරම්පරාව බොහෝය. පාඨක පරම්පරාව ද බොහෝය. මෙරට ප්‍රතිපත්ති නිර්දේශ කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් හඳුන්වා දුන් එකම පුවත් සඟරාව වන්නේ ද ‘‘දෙසතිය’’ යි. විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති, සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ ප්‍රධාන වගකීම උරට ගත් දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත් විය. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරක් යොදා ගනිමින් පාඨක රුචිය වඩවන ලෙස ඉදිරිපත් කිරීමට දෙසතිය සඟරාව සමත් වී තිබේ.

දෙසතියට අමතරව ‘‘තොරතුරු’’ නමින් සතිපතා පුවත්පතක් ද, ‘‘Alliance’’ නමින් ඉංග්‍රීසි පුවත්පතක් ද එකල පල කර තිබේ.

ඉතා සුළු කාර්යමණ්ඩලයක් යටතේ ආරම්භ කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂය අවසානය වන විට ස්ථීර, අනියම්, කොන්ත්‍රාත් හා දෛනික සේවාවන්හි නිරත සේවක සංඛ්‍යාව 233ක් විය.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් හිමි කර ගන්නේ සෘජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමග සම්බන්ධ ආයතනය වන බැවිනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුම ය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය කළ අතර, එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

1993 දී රාජ්‍ය නොවන රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. එම මධ්‍යස්ථානය කොළඹ කොටුව, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ආරම්භ කෙරිණි. ඒ සමඟම මාධ්‍යවේදීන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා "Press Club" එහි පිහිටුවන ලදි.

ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයෙන් දෙපාර්තමේන්තුව හදිසියේ ඉවත් කරන ලද අතර, පසුව කොල්ලුපිටියේ පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකකට ආයතනය ගෙන ගොස් තිබේ.

රාජ්‍ය ජනමාධ්‍ය ව්‍යුහයේ පැවති සීමා හඳුනාගෙන ජනතාව වඩාත් සංවර්ධන කාර්යභාරයට දායක කර ගැනීම රජයේ අරමුණ වූයෙන්, විශේෂයෙන් රජයේ කෘෂි කාර්මික නවෝදය, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සර්වජන ඡන්ද බලයේ ජනතා මෙහෙවර යනාදී කරුණු පිළබඳව ජනතාව දැනුවත් කිරීමේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම වඩාත් සාර්ථකව ඉටු කිරීමට රජයේ චිත්‍රපට අංශය, ප්‍රකාශන කාර්යාංශය ඉතා පුළුල් මෙහෙවරක් එදා යුගයේදී ඉටු කර තිබේ.

ආරම්භක යුගයේ සිටම රජයේ ප්‍රචාරන වැඩපිළිවෙළ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ඉටු කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන අත්පත්‍රිකා, සඟරා හා ප්‍රකාශන නිතිපතා බෙදා හැරීමට ද කටයුතු කර තිබේ. මෙම කාල පරිච්ඡේදයේදී විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන පළ කරනු ලැබූ "Week Happening in the Island" සඟරාවද "Introduction Ceylon" ආදී ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ තොරතුරු විදේශ රටවලට ලබා දීමට කටයුතු කර තිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා "Sri Lanka Today" නමින් තෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේ ප්‍රකාශන කාර්යාංශය ද ඉතා පුළුල් අරමුණක් යටතේ පවත්වාගෙන යමින් රජයේ නිල ප්‍රකාශන පිළිබඳව නීති, අණපනත් මහජනතාවට මිලදී ගැනීම සඳහා මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබේ. මෙහි ආරම්භක නිලධාරියා ලෙස සේවය කර ඇත්තේ R.V.H.Vantwest මහතාය.

ජුලියෝ පෙට්ට්‍රෝනි මහතාගෙන් ආරම්භ වූ රජයේ චිත්‍රපට අංශය, නිදහසින් පසු මෙරට සිදු වූ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය මගිනි. පසුකාලීනව කීර්තිමත් වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රාශියක් බිහි කළ මෙම අංශය, පැරිස් ජාත්‍යන්තර චිත්‍රපට උළෙල ආදී විදේශ සිනමා සම්මාන උළෙල රාශියකදී වාර්තා හා අර්ධ වාර්තා අංශයෙන් ශ්‍රී ලංකාවට සම්මාන දිනා දී ඇත.

1948 නිදහසත් සමග ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාභැකි උපරිමය දක්වා යන, සිය ගමන් මගේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැලපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2021 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන ගියේය. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප අංශය, රජයේ සමාජ මාධ්‍ය ඒකකය, දෙසතිය සඟරා අංශය, නව මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් අංශය, ප්‍රචාරක අංශය සහ පර්යේෂණ හා විමර්ශන අංශවලින් සමන්විත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් .....

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

1948 - පී.නඩේශන් මහතා

1949 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1950 - වී.ටී.ආර්.විවියන් හොරයින් මහතා

1952 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1955 - නඩේශන් පරරාජශිංගම් මහතා

1956 - ජී.ලයනල් පෙරේරා මහතා

1957 - ජී.ඩබ්.ඒ.එම්.පෙරේරා මහතා

1958 - ජේම්ස් පෙරේරා මහතා

1959 - ටී.එම්.ජයරත්නම් මහතා

1960 - තිලක් එරංග ගුණරත්න මහතා

1961 - ඩබ්.එල්.ප්‍රනාන්දු මහතා

1962 - එස්.බී.සේනානායක මහතා

1966 - ඩී.අළුවිහාරේ මහතා

1967 - පී.එන්.මැද්දේගොඩ මහතා

1968 - ආචාර්ය එස්.එල්.බී.අමුණුගම

1972 - පී.එච්.ප්‍රේමවර්ධන මහතා

1974 - ඩබ්.ආර්.පී.තිලකරත්න මහතා

1977 - එස්.අනුර ගුණසේකර මහතා

1983 - මානෙල් අබේරත්න මහත්මිය

1990 - කේ.එස්.විමලසේන මහතා

1991 - කේ.ආර්.එල්.විජේවර්ධන මහතා

1992 - මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

1994 - ආරිය රුබසිංහ මහතා

2003 - කේ.ඒ.බී.ජේ.පී.ජයසේකර මහතා

2004 - ඩබ්.එම්.පියසේන මහතා

2005 - කාන්ති විජේතුංග මහත්මිය

එස්.ඩී.පියදාස මහතා

2006 - වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන් .....

2009.02.01 දින සිට 2010.05.06 දින දක්වා - වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා

2010.05.07 දින සිට 2015.01.08 දින දක්වා - මහාචාර්ය ආරියරත්න ඇතුගල

2015.01.13 දින සිට 2015.05.07 (වැ.බ.) දින දක්වා- කේ.ඩබ්.ටී.එන්.අමරතුංග මහත්මිය

2015.05.08 දින සිට 2017.06.02 දික දක්වා - ආචාර්ය දර්ශනී ගුණතිලක

2016.06.06 දින සිට 2017.09.29 දින දක්වා - ආචාර්ය රංග කලන්සූරිය

2017.10.13 දින සිට 2018.10.26 දින දක්වා - නීතීඥ සුදර්ශන ගුණවර්ධන මහතා

2018.10.27 දින සිට 2021.04.07 දින දක්වා - කේ.එම්.ජී.එස්.නාලක කලුවැව මහතා

2021.04.19 දින සිට මේ දක්වා - මොහාන් සමරනායක මහතා

දැක්ම

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"

මෙහෙවර

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලී පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම"

අරමුණු

- රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාම ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
- උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම
- වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීමට අනුබලදීම හා නායකත්වය සැපයීම
- ඉහත අභිමාර්ථ සපුරා ගැනීම සඳහා මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම
- ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවයන්වලට අනුගත වෙමින් (ඩිජිටල්කරණය) තොරතුරු තාක්ෂණය, ගෝලීය ප්‍රවණතාවයන්ට අනුකූලව කළමනාකරණය කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

----- කාර්යභාරය -----


ඉහළ සංවර්ධන මට්ටමක් සහ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන සහභාගී කර ගනිමින් සන්නිවේදනයෙන් දායක වීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේය.

----- වැඩසටහන් ඉදිරිපත් කිරීම් පෙළගැස්ම -----

- ප්‍රාග්ධන වැඩසටහන්
    - අරමුණ
    - වර්තමාන ප්‍රගතිය
    - ඉදිරි අපේක්ෂාවන්

- සංවර්ධන වැඩසටහන් (දෛනික හා කෙටි කාලීන ව්‍යාපෘති)
    - ක්‍රියාත්මක වන ආකාරය
    - ප්‍රගතිය

1.4. සංවිධාන සටහන



**. නිලධාරියාගෙන් පසු තනතුර අහෝසි වීමට යටත්ව අනුමත වී ඇති තනතුරු නාම

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

01. පාලන අංශය
02. ගිණුම් අංශය
03. රජයේ චිත්‍රපට අංශය
04. ප්‍රචාරක අංශය
05. රජයේ සමාජ මාධ්‍ය ඒකකය
06. නව මාධ්‍ය ඒකකය
07. දෙසතිය හා දෙසතිය බෙදා හැරීම් ඒකකය
08. ඡායාරූප ඒකකය
09. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය
10. මාධ්‍ය හැඳුනුම්පත් අංශය
11. ඩිජිටල් යටිතල පහසුකම් අංශය
12. රජයේ ප්‍රකාශන කාර්යාංශය
13. පර්යේෂණ හා මාධ්‍ය විමර්ශන අංශය
14. පුස්තකාලය

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන නැත

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නැත

02
පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සෑම විටම නව තාක්ෂණය උපයෝගී කොට ගනිමින් රජයේ නිල පුවත් සන්නිවේදනයේ ප්‍රමුඛයා බවට පත් වීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්මයි.

නවීන තාක්ෂණයත් සමග වර්තමානයේ දෛනික කටයුතු සම්ප්‍රදායික කාර්යන්ගෙන් ඔබ්බට ගිය ඩිජිටල් තාක්ෂණයත් සමග සියලු කාර්ය ඩිජිටල්කරණයට (Digitalization) ලක්වෙමින් කාර්යයන් වඩාත් පහසුවෙන් සිදු කෙරෙන ඩිජිටල් අවකාශය තුළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරියට පියවර තබමින් සිටියි.

සියලු මාධ්‍ය ආයතන සමග සම්බන්ධීකරණයෙන් ප්‍රවෘත්ති / තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර, රජයේ සියලු කාලීන හා සංවර්ධන තොරතුරු රජයේ සහ පෞද්ගලික මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය වෙත ලබා දීමේ රජයේ යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරයි.

එසේම වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ ජනතාවට විශ්වසනීය තොරතුරු සන්නිවේදනය කිරීමේ ඩිජිටල් වේදිකාව මෙම වසරේ ඉහළ මට්ටමට ගෙන ඒමට හැකිවීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාලය කඩිනමින් තොරතුරු සන්නිවේදනය කරන ජාලයන් වීම විශේෂත්වයකි.

ඩිජිටල්කරණයේ සුවිශේෂී අවස්ථා

සමාජ මාධ්‍ය ජාලය තුළ බොහෝ අවස්ථාවල සාවද්‍ය තොරතුරු සංසරණය වන බැවින් හැම විටම ජනතාවට ලැබෙන තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වසනීයත්වය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව www.dgi.gov.lk, “Department of Government Information” YouTube නාලිකාව සහ Face Book පිටුව සහ www.news.lk වෙබ් අඩවිය,YouTube නාලිකාව සහ Face Book පිටුව හා Twitter යන සියලු ජාල ඔස්සේ විශ්වසනීය තොරතුරු ජනතාව වෙත සෘජුව සන්නිවේදනය කරයි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණයේ සුවිශේෂී ජයග්‍රහණ

	වැඩසටහන	ක්‍රියාත්මක කිරීම
මාධ්‍ය වෙත පහසුකම් සැලසීම		
01	මාධ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය සඳහා cloud අවකාශය භාවිතය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, මාධ්‍ය වෙත තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඔබ්බට ගොස් වීඩියෝපට, හඬ පට, ඡායාරූප, ප්‍රවෘත්ති නිවේදන සියල්ල සියලු මාධ්‍ය වෙත එකම මොහොතක් තුළ කඩිනමින් ලබා දෙයි
02	දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ මාධ්‍ය වෙත කඩිනමින් නිකුත් කිරීම	රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් නිවේදන සහිතව වීඩියෝපට, හඬ පට, ඡායාරූප යනාදිය මාධ්‍ය වෙත නිකුත් කරයි පෙර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර, දැන් මනා සම්බන්ධීකරණයෙන් සියලුම මාධ්‍ය ආයතන සහභාගී කර ගැනීමට හැකි වී තිබේ
03	ඊමේල් System සකස් කිරීම	මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් 200කට ආසන්න ඊමේල් පද්ධතියක් තුළින් තොරතුරු හුවමාරු කර ගනු ලැබේ
04	සියලුම මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීම	ලිපිගොනු පාදක කොටගෙන මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම වෙනුවට දත්ත පද්ධතියක් (Data Base) භාවිතයෙන් එය ඉටු කිරීමට සමත් වී ඇත
ජනතාව වෙත සෘජුව තොරතුරු ලබාදීම		
	“Department of Government Information” YouTube විකාශය පවත්වාගෙන යාම	Department of Government Information You Tube නාලිකාව 2019 වසරේ ජනවාරී වන විට අක්‍රිය තත්ත්වයේ ප්‍රේක්ෂකයින් 12 දෙනෙකු පමණක් සිටි අතර, එම වසර අවසන් වන විට 1000කට වැඩි පිරිසක් ඒ සඳහා එක් කර ගැනීමට හැකි වූ අතර 2021 වන විට ප්‍රේක්ෂක සංඛ්‍යාව විශාල වශයෙන් වර්ධනය විය. එහිදී වීඩියෝ පට විවිධ තේමා ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. එනම්, INFO News, INFO Highlights, ඇතුළාන්තය (Inside), INFO News Parliament Highlights, Provincial Highlights, Taller, Documentary, Short Video Reel ආදී වශයෙනි. මේ

		සියල්ල දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂ ජයග්‍රහණයන් වේ. දෙස් - විදෙස් විශාල ජනතාවක් මෙම YouTube නාලිකාව සමග එක්ව සිටින අතර ඉහළ ජනතා ප්‍රසාදයක් ඊට ලැබී ඇත
	"Department of Government Information" Face Book පිටුව පවත්වාගෙන යාම	මේ වන විට දෙපාර්තමේන්තුවේ face book පිටුව සමග ඉතා විශාල පිරිසක් එක්ව (like) සිටිති. අන්තර්ගතය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීමට අවධානය යොමු වූ පසු face book like, people reached, engage සංඛ්‍යාව දිනෙන් දින ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි විය. කාලීන හා සංවර්ධන ප්‍රවෘත්ති ඇතුළත් වීඩියෝ පට (You Tube නාලිකාවේ සියලුම වීඩියෝ) නිර්මාණාත්මක post සහ ඡායාරූප කෙටි විස්තරයක් සහිතව මෙහි යාවත්කාලීන කිරීම සිදු වේ. දැන් සතියකට ලක්ෂයට වැඩි reached සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට හැකි වී තිබේ.
	www.news.lk web අඩවිය	කාලීන හා සංවර්ධන සියලුම ප්‍රවෘත්ති මෙම වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කිරීම, භාෂා ත්‍රිත්වයෙන්ම සිදු වන අතර පැය 24 පුරා යාවත්කාලීන වන රජයේ නිල පුවත් වෙබ් අඩවිය මෙයයි. මෙම වෙබ් අඩවිය යටතේ Face book පිටුව, You Tube නාලිකාව, Twitter පිටු ක්‍රියාත්මක වේ. එසේම කැබිනට් මාධ්‍ය සාකච්ඡාව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සජීවී විකාශය පවත්වාගෙන යාම ආරම්භ කර ඇති අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතී.
	දෙසතිය සඟරාව	ජනතාව වෙත කාලීන හා සංවර්ධන මෙන්ම විදෙස් තොරතුරු කැටි කරගත් වසර 43ක ඉතිහාසයකට හිමිකම් කියන දෙසතිය සඟරාව නියමිත පිරිදි, නියමිත දිනට නිකුත් කිරීමට උත්සාහ දරණ ලදි. නමුත් රටතුළ පැවති කොවිඩ් - 19 වසංගතය හමුවේ මාස ගණනාවක් ආයතනයේ වැඩ කටයුතු අඩපණ වුවද නිවෙස්වල සිට රාජකාරී ඉටු කරමින් 2021 වර්ෂය තුළ ඉතා ඉහළ නිමාවකින් හා ප්‍රමිතියකින් යුතුව දෙසතිය සඟරා දහසයක් (16) මුද්‍රණය කර ඇත. දෙසතිය සඟරාව බෙදාහැරීම ලෙක්හවුස් ආයතනයට භාර දෙමින් මුළු ලංකාවම ආවරණය වන විධිමත් බෙදා හැරීමේ ජාලයක් ඔස්සේ සඟරාව පාඨකයන් වෙත ලබා දීමට කටයුතු කෙරිණි.

මාධ්‍ය සංරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම		
	ඩිජිටල් සංරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම	දෙපාර්තමේන්තුව සතුව පවතින ඓතිහාසික වැදගත් චිත්‍රපට, වීඩියෝ පට, ඡායාරූප යනාදිය ඩිජිටල් තාක්ෂණයට හැරවීමේ (Convert to Digital) ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබේ. මේ වන විට පැරණි චිත්‍රපට 100ක් පමණ ඩිජිටල් තාක්ෂණයට convert කර, සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත ඊට අමතරව ඩිජිටල් සංරක්ෂිත පද්ධතිය ස්ථාපනය කිරීම පසුගිය වසරේ සිදු වූ ප්‍රධාන කාර්යයක් වූ අතර එහි විශේෂිත වූ වීඩියෝ පට, ඡායාරූප සංරක්ෂණය කිරීම එදිනෙදා සිදු කෙරෙන කාර්යයක් බවට මෙම වසර තුළ ද පත් කිරීමට හැකි වීම.

මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ පහසුකම් විධිමත් ලෙස පුළුල් කිරීම

යහපත් සාමාජ පැවැත්මක් උදෙසා විශ්වසනීයත්වයෙන් සත්‍ය තොරතුරු වාර්තාකරණය උදෙසා මාධ්‍ය ආයතන තොරතුරුවලින් සන්නන්ධ කිරීම කාලීන අවශ්‍යතාවකි. රජයේ සංවර්ධන හා කාලීන තොරතුරු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මාධ්‍ය වෙත සන්නිවේදනය කිරීම පිණිස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව Cloud තාක්ෂණය භාවිත කරමින් මාධ්‍ය ආයතන වෙත වීඩියෝ පට, ඡායාරූප, මාධ්‍ය නිවේදන යන සියල්ල කඩිනමින් ලබා දීමේ විධිමත් ක්‍රමවේදය ආරම්භ කර තිබේ.

විශේෂ ජයග්‍රහණ,

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දියුණු, ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම උදෙසා මෙම දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ විෂය යටතේ 2021 වර්ෂයේ කටයුතු සිදු කර ඇත.

1. වෘත්තීය ජනමාධ්‍ය විෂයය පුළුල් කිරීම, ජනමාධ්‍ය අධ්‍යාපනය දියුණු කිරීම හා ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම සඳහා වෘත්තීය මට්ටමේ ජනමාධ්‍ය ශාස්ත්‍රීය කෘතිය එනම්, ජනමාධ්‍ය සංකථන කෘතිය එළි දැක්වීම

2. ගුණාත්මක වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාල ජනමාධ්‍ය අධ්‍යයන අංශ ඒකාබද්ධව ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරි ගමන් මග කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳව ශාස්ත්‍රීය දැනුම හුවමාරු කිරීම හා වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම හා එම තොරතුරු රජය වෙත ලබා දීම

3. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරි දිශානතිය තීරණය කිරීම සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ජනමත නායකයින්, සිවිල් සංවිධාන හා පුරවැසියන්ගේ අදහස් ලබා ගැනීම හා එම අදහස් පිළිබඳ රජයේ අවධානය සඳහා යොමු කිරීම

4. යහපත්, ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම උදෙසා ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජනමාධ්‍ය අධ්‍යාපනය පාසල් මට්ටමින් දියුණු කිරීම සඳහා පාසල් ජනමාධ්‍ය විෂය උගන්වන ගුරුවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම හා එම තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම,

ඒ යටතේ,

- පාසල් ජනමාධ්‍ය සමාජ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම
- පාසල් ජනමාධ්‍ය සමාජ ලියාපදිංචි කිරීම
- පාසල් ජනමාධ්‍ය ඒකක සඳහා බිත්ති පුවත්පත් ලබා දීම
- පාසල් ජනමාධ්‍ය විෂය උගන්වන ගුරුවරුන්ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා දීම සහ තොරතුරු ඒකරාශි කිරීම

5. ජනමාධ්‍ය වෘත්තීය අධ්‍යාපනය හා ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ,

- ත්‍රිවිධ හමුදා හා පොළිස් මාධ්‍ය ඒකකවල වෘත්තීය ජනමාධ්‍ය නිලධාරීන් ලෙස ක්‍රියා කරන නිලධාරීන්ට ප්‍රායෝගික ජනමාධ්‍ය දැනුම ලබා දීම (එක් වැඩසටහනක් දැනට ක්‍රියාත්මක කර ඇත)

6. සෞභාග්‍යයේ දැක්ම යටතේ දියුණු සංස්කෘතික මිනිසෙක් බිහි කිරීම සඳහා ජනමාධ්‍ය සතු සමාජ වගකීම යටතේ මාසිකව පවත්වනු ලබන චිත්‍රපට රසවින්දන වැඩසටහන් මාලාවක් පැවැත්වීම (කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වැඩසටහන් පැවැත්වීමට බාධා පැමිණ ඇත)

7. සමාජ මාධ්‍ය ප්‍රවනතා හඳුනා ගනිමින් ඒ ඔස්සේ වෙබ් අඩවි යාවත්කාලීන කිරීම, ප්‍රවෘත්ති සම්පාදනය, සමාජ මාධ්‍ය ජාල සක්‍රීය ලෙස පවත්වාගෙන යාම සිදු කිරීම

8. නව මාධ්‍ය ඔස්සේ මැතිවරණ සජීවී විකාශ කටයුතු සිදු කිරීම හා කැබිනට් මාධ්‍ය හමුව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සමාජ මාධ්‍ය ඔස්සේ සජීවී ලෙස විසුරුවා හැරීම

9. කාලයක් අක්‍රීයව පැවති රජයේ නිල ජංගම කෙටි පුවත් සේවය යළි සක්‍රීය කොට සිංහල හා ඉංග්‍රීසි යන භාෂාවලින් පවත්වා ගෙන යාම ආරම්භ කිරීම

10. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මාධ්‍ය ඒකක, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ම කේන්ද්‍ර කර ගනිමින් ස්ථාපිත කර ඇත.

11. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක ෆේස්බුක් පිටුව වෙත ප්‍රවෘත්ති ඇතුළත් කරන අතර Zoom තාක්ෂණය ඔස්සේ දිස්ත්‍රික් මාධ්‍ය ඒකක ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

12. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මඟින් මාධ්‍ය චාරිකා සංවිධානය කිරීම

"ගම සමඟ පිළිසඳරක්" ව්‍යාපෘතියට අදාළ මාධ්‍ය චාරිකා කෑගල්ල, මහනුවර, ත්‍රිකුණාමලය, කළුතර හා මාතලේ දිස්ත්‍රික්කවල පවත්වා ඇත.

තව ද සෞභාග්‍යා ගම්මාන ව්‍යාපෘතියට අදාළ මාධ්‍ය චාරිකා කෑගල්ල දිස්ත්‍රික්කයේ පවත්වා ඇත.

13. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක නිලධාරීන් උදෙසා වාර්ෂික අභිප්‍රේරණ වැඩමුළු පැවැත්වීම

අභියෝග හා ඉදිරි ඉලක්ක

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය ඉටු කරන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වේ. එසේම ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීම සමාජ මාධ්‍ය හා වෙබ් අඩවි ඔස්සේ පුළුල්ව සිදු කිරීම තුළින් ජනතාව නිවැරදි තොරතුරුවලින් හා දැනුමින් සන්නද්ධ කරලීම උදෙසා ජනමාධ්‍ය වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා වූ පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සමාජය තුළ ස්ථාපිත කිරීමට පෙරමුණ ගෙන ක්‍රියා කිරීමට 2022 වර්ෂයේදී මූලික වශයෙන් අපේක්ෂිතය.

මොහාන් සමරනායක

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් / ගණන් දීමේ නිලධාරී

03
පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්යසාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		328,786,100	236,775,000	ඒසීඒ-3
-	තැන්පතු		1,368,742	20,959,326	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		12,424,365	9,234,353	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**342,579,207**	**266,968,679**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**342,579,207**	**266,968,679**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,256,028	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඇ)		**341,323,179**	**266,968,679**	

	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
180,320,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	165,108,537	155,804,392	
115,025,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	95,701,873	81,077,889	ඒසීඒ-2(ii)
1,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,403,139	1,717,002	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	15,300	
296,845,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**262,213,549**	**238,614,583**	
	මූලධන වියදම්				
63,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	18,964,137	20,432,358	
172,626,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	61,447,644	5,743,484	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
5,500,000	හැකියා වර්ධනය	14	714,500	511,194	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
241,626,000	**මුළු මූලධන වියදම් (උ)**		**81,126,281**	**26,687,036**	
-	තැන්පතු ගෙවීම්		1,795,836	21,300,737	ඒසීඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		12,527,049	9,285,036	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**14,322,884**	**30,585,773**	
-	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**357,662,714**	**295,887,392**	
-	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		**(16,339,536)**	**(28,918,713)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(16,339,536)	(28,918,713)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(16,339,536)	**(28,918,713)**	

3.3 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පි

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	2021 (රු.)	2020 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,820,584,025	1,768,395,025
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	37,117,831	37,015,148
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**1,857,701,856**	**1,805,410,173**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		28,955,013	28,425,236
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,820,584,025	1,768,395,025
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසීඒ-4	8,162,818	8,589,912
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**1,857,701,856**	**1,805,410,173**

පිටු අංක 07 සිට 49 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 50 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද, මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තා කරන ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : අනුෂ පැල්පිට
තනතුර : ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය
දිනය : 2022.02.26

පී.පී.කේ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, "ඇසිදිසි මැදුර", කිරුළපන මාවත,
පොරළුන්ත්ගොඩ, කොළඹ-05.

.....
ගණන්දීමේ නිලධාරි
නම : මොහාන් සමරනායක
තනතුර : ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2022.02.21

මොහාන් සමරනායක
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05

.....
ප්‍රධාන ගණකාධිකාරී
නම : එච්.ඒ.යූ. ජයලත්
දිනය : 2022.02.21

එච්. ඒ. යූ. ජයලත්
ප්‍රධාන ගණකාධිකාරී
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
163, කිරුළපන මාවත,
කොළඹ 05.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්සා	
		නැවත ගලපන
	2021 (රු.)	**2020 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	15,092,249	20,989,638
අග්‍රිම ලැබීම්	328,786,100	236,775,000
අත්තිකාරම් අයකර ගැනීම්	9,856,343	6,779,043
තැන්පතු ලැබීම්	1,368,742	20,959,326
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**355,103,433**	**285,503,007**
අඩු කළා - මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	274,673,473	248,587,290
සහනාධාර සහ මාරු කිරීම්	1,403,139	1,717,002
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	6,308,509	6,827,049
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,256,028	-
අත්තිකාරම් ගෙවීම්	10,946,593	1,787,218
තැන්පතු ගෙවීම්	1,795,836	21,300,737
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**296,383,578**	**280,219,296**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**58,719,855**	**5,283,711**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්	58,719,855	5,451,784
ආයෝජන අත්පත් කර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)	**58,719,855**	**5,451,784**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
(ඊ) = (ඇ) - (ඉ)	**(58,719,855)**	**(5,451,784)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ) = (ඇ) + (ඊ)	**0**	**(168,073)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	**-**	**-**
අඩු කළා - මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)= (උ)–(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) + (ඒ)	**0**	**(168,073)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	168,073
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**(0)**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1). වාර්තාකරණ කාල පරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

(2). මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර, සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3). ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4). දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

(5). දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

(6). මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස
20.06.02.01	වාහන	-	-	-	-
20.06.02.02	අනෙකුත්	-	-	166.405	0
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	-	-
20.02.01.99	රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී	-	-	-	-
20.02.02.99	පොළිය - අනෙකුත්	1,000	1,000	1,600.703	160.07
20.03.01.00	විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්	1,200	600	1,239.692	206.62
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ	-	7	187.263	2675.19
20.03.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	-	-	-	-
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	500	150	480.829	320.55
20.05.99.00	වර්තන පැවරීම්, ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්	-	-	-	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.296,845,000.00	රු.296,845,000.00	රු.262,213,548.21	88.33
ප්‍රාග්ධන	රු. 241,626,000.00	රු. 241,626,000.00	රු. 81,126,281.73	33.58

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	වරිපනම් බද්ධ ගෙවීමට	-	560,844.00	560,844.00	100
		අමාත්‍යාංශ බදු අංශය	-	150,000.00	111,350.60	74

		දෙපාර්තමේන්තු ගොඩනැලිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට				
		කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශ මාධ්‍ය ලේකම්වරුන්ට සංවර්ධන සන්නිවේදනය පිළිබඳව ප්‍රායෝගික දැනුමක් ලබා දීමේ වැඩමුළුවේ ශාලා පහසුකම් හා සංග්‍රහ සඳහා ගෙවීම	-	100,000.00	100,000.00	100
		ආරක්ෂක සේවාව සැපයුම සඳහා ගෙවීම	-	4,139,100.00	3,578,580.00	86
02.	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ඔවුන්ගේ මුද්‍රණ අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 25%ක් ගෙවීමට	-	1,200,000.00	927,921.64	77
03.	බුද්ධ ශාසන අමාත්‍යාංශය	ආරක්ෂක සේවාව සැපයුම සඳහා ගෙවීම	-	573,156.00	-	0
			-	**6,723,100.00**	**5,278,696.24**	**79**

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	300,848,000.00	-	-
9152	යන්ත්‍රෝපකරණ		288,986,024.86	-	-
9153	ඉඩම්		1,227,750,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්		-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-	-	-
9160	කෙරීගෙන යන වැඩ		3,000,000.00	-	-
9180	බදු දෙන ලද වත්කම්		-	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය කර, (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 2021/03 හි 7.6 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමයට පිළියෙල කළයුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හරස් සටහන් රහිතව දැක්වීම හේතුවෙන් රු.3,157,959 ක් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.159,870 ක්, රු.150,700 ක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	2020.12.19 දින මියගිය බී. එස්. ඩී. ප්‍රේමසුන්දර මහතාගේ රු. 159,870/= ක ණය ශේෂය මරණ පාරිතෝෂිතයෙන්ද 2021.12.31 දින විශ්‍රාම ගොස් ඇති එම්.ඒ. ජයසිංහ මයාගේ රු. 150,700.00ක මුදල මෙම වර්ෂය තුළදී විශ්‍රාම පාරිතෝෂිතයෙන්ද අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	සේවය හැර ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 211,486 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ තුළ වර්ෂ 05 ට වැඩි රු.179,740 ක ණය ශේෂයක්ද අන්තර්ගත වී තිබුණි.	1997 වර්ෂයේදී සේවය හැර ගිය ඕ.සී.එල්. සිල්වා මහතාගේ රු. 123,475ක මුදලත්, 2001 වර්ෂයේදී සේවය හැර ගිය එම්.ආරියරත්න මහතාගේ රු. 56,265ක මුදලත් අය කර ගැනීම සම්බන්ධයෙන් තොරතුරු සහ ලේඛන පිටපත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර අදාළ උපදෙස් ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. ආපදා ණය ශේෂය වූ රු. 31,746 ක මුදල 2022 මාර්තු මස ගිණුම් ශීර්ෂ මගින් නිරවුල් කර ඇත.	හිහ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
හානි පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කරමින් පවතියි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂයයන් 09 ක රු.27,150,000ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසුද රු.82,193,819ක් ඉතිරිවී තිබුණි.	කොවිඩ් 19 හේතුවෙන් ප්‍රචාරක වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක නොවීම, දෙපාර්තුමේන්තුව සතු වාහන කළමනාකරණය තුලින් අවශ්‍යතා ඉටුකර ගැනීම, නිලධාරීන් ස්ථාන මාරුවීම, වවුචර් ඉදිරිපත් නොවීම හා අවශ්‍යතා ඇති නොවීම, බලාපොරොත්තු වූ පරිදි නඩත්තු කටයුතු නොවීම, නව ගොඩනැගිලි ඉදි කිරීම අත්හිටුවීම ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇත.	ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව සකස් කළ යුතුය.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ වැය විෂයයන් 07 ක එකතුව රු. 1,162,393 ක් වටිනා බැරකම් 15 ක් 2022 වර්ෂයේ පෙබරවාරි අවසන් වන විටද පියවීමට කටයුතු කර නොතිබුණි.	දුරස්ථ අධ්‍යාපන ආයතනය වෙත 2022.04.01 දින රු. 40,000 ක මුදල , 210 – 02 – 2401 වැය විෂය යටතේ ගෙවීම් කටයුතු කර ඇත. ඉතිරි බැරකම් මේ වන තෙක් ගෙවීමට ඉදිරිපත් වී නැත.	බැරකම් පියවීමට කටයුතු කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂයේ රු. 763,252 ක් වූ බැරකම් 06 ක් 2022 වර්ෂයේ වැය ලෙජරවල සටහන් කිරීමේදී පෙර වර්ෂවල ගිණුම්ගත බැදීම් ලෙස සටහන් නොකර පවත්නා වර්ෂයේ ගිණුම්ගත බැදීම් ලෙස දක්වා තිබුණි.	නිරීක්ෂණය නිවැරදියි. වැය ලෙජරය නිවැරදි කිරීමට කටයුතු කරමි.	බැදීම් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතුය.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II කාණ්ඩයේ**	-	ප්‍රවාහන අංශයේ රාජකාරී කළ කාලසීමාව තුළ වාහන අලුත්වැඩියාවේදී සහ වාහන ලිපිගොනු පවත්වාගෙන යාමේදී සිදුකර ඇතැයි පැවසෙන අක්‍රමිකතා	ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MMI/AD/2/1/-vol iහා 2021.09.23 දිනැති ලිපිය මගින් නිලධාරිනිය සම්බන්ධයෙන්	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ

	XLVIII පරිච්ඡේදයේ 4.1 වගන්තිය අනුව 2:2:1 වැනි උප වගන්තිය		සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට යටත්ව ප්‍රවාහන අංශයේ නිලධාරිනියක් 2021 නොවැම්බර් 23 දිනැති රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් තාවකාලිකව ද්විතීය පදනම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත මුදාහැර තිබුණ ද 2022 මාර්තු 03 දක්වා එවැනි විමර්ශනයක් සිදුකර නොතිබුණි. එසේම වාහන අලුත්වැඩියා හා සේවා කිරීම් අනුමත කරන අධ්‍යක්ෂ (පාලන) 2021 ඔක්තෝබර් 26 දින වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත මාරු කර තිබූ අතර ප්‍රවාහන අංශයේ ලිපිගොනු භාර කළමනාකරණ සේවා නිලධාරිනිය ද්විතීය පදනම මත ද විමර්ශනයකින් තොරව සේවයෙන් මුදාහැර තිබුණි.	පරීක්ෂණයක් පැවැත්වීම සඳහා තැපැල් අංශයේ නීති නිලධාරිණී, එම්.ඒ.එච්.අතුකෝරල මිය පත් කර ඇති අතර එම පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී.	යුතුය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	(i) මු.රෙ.571	7,652,315	කල් ඉකුත් වූ තැන්පතු, රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණු අතර වර්ෂ 12ක් පැරණි රු.7,488,595 ක තැන්පතු ඊට ඇතුළත් වී තිබුණි.	නව මාධ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතුවලට අදාළ රඳවා ගත් මුදල් පොදු තැන්පත් ගිණුමේ ඉතිරිව ඇත. අලාභ තක්සේරු කරමින් පවතී. අලාභ අය කළයුතු අයිතම 10න් 9ක් සඳහා අලාභ	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

			තක්සේරු කර ඇත. එක් අයිතමයක අලාභය තක්සේරු කර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ලබා දී නැත. එම වටිනාකම ලද පසු අය කිරීම සිදු කරනු ලැබේ.	
(ii) මූ.රෙ.802 (1)	2021 දෙසැම්බර් 31 වන විට දෙපාර්තමේන්තුව සතු වාහන 07 ක් මාස 3 සිට 15 දක්වා වූ කාලයක් තුළ නිෂ්කාර්යව පැවතුණි.	2021 වසරේ කොවිඩ් රෝග ව්‍යාප්ත තත්ත්වය මත දෙපාර්තමේන්තු රාජකාරී සීමා සහිතව සිදු කළ බැවින් වාහන ධාවනය ද ගරාජය වසා තිබීම හේතුවෙන් වාහන අලුත්වැඩියාද කිරීමට නොහැකි විය.		- එම -

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පරිගණක 42 ක අවශ්‍යතාවය සඳහා 2021 මැයි සහ අගෝස්තු මාසවල අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවා තිබුණු අතර, එකවර මිලදී නොගැනීම හේතුවෙන් මිල ඉහළ යාම මත පරිගණක 11 සඳහා රු.4,189,600 ක් වැඩිපුර ගෙවා තිබුණි.	දෙපාර්තමේන්තු අංශ සඳහා පරිගණක 52 ක් මිලදී ගැනීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් නිරීක්ෂණය කර තිබුණි. පරිගණක 39 ප්‍රධාන ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම කල්ගත වන බැවින් නිෂ්පාදන අංශය සඳහා හදිසි අවශ්‍යතාවයක් සේ සලකා පරිගණක 03 ක් මිලදී ගැනීම සඳහා 2021.05.24 දින මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදී. මේ අතර ප්‍රධාන ප්‍රසම්පාදන සඳහා පිළිතුර සකස් කර අවශ්‍යතාවය හඳුනා ගැනීම සිදුකර ඇතත් කොවිඩ් වසංගතය යටතේ නිලධාරීන් සේවයට කැඳවීම සීමා වීම මත කමිටු රැස්වීම් පැවැත්වීමේ ගැටළු ඇති විය. ඒ අනුව ප්‍රසම්පාදන දෙකක් යටතේ මිලදී ගැනීම නිසා ප්‍රධාන ප්‍රසම්පාදනයට වඩා අඩු මුදලකට නිෂ්පාදන අංශය සඳහා පරිගණක 03 ක් මිලදී ගැනීමට හැකියාව ලැබී ඇත.	ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී ආයතනයට වඩාත් වාසි සැලසෙන අන්දමින් කටයුතු කළ යුතුය.

3.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2022 මැයි 31 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාහන අලුත්වඩියාව සහ සේවා කිරීම් සිදු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව පරීක්ෂා කිරීම	2022 වර්ෂයේ මාර්තු 07 දිනෙන් පසුව එවන ලද විගණන විමසුම් 06 සඳහා පිළිතුරු සකස් කරමින් පවතින අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.
(ආ)	වාහන ලිපි ගොනු පවත්වාගෙන යාමේදී සිදු කරන ලද අක්‍රමිකාතා පිළිබඳව පරීක්ෂා කිරීම.		විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඇ)	දෙපාර්තමේන්තුවේ සේවයෙන් මුදා හැරීම් පිළිබඳ පරීක්ෂා කිරීම.		විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2021 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම විගණනය		විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය		විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඊ)	මූල්‍ය විගණනය 2021		විමසුමේ සඳහන් කාලය තුළදී පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවක් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයකු 2022 ජූලි වන විටත් පත්කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන තනතුරෙහි පුරප්පාඩුව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිලධාරියෙකු පත් කර එවීම මගින් සම්පූර්ණ කළ යුතු වේ. මෙම දෙපාර්තමේන්තුව කිහිප අවස්ථාවකදීම මෙම පුරප්පාඩුව පිරවීමට ක්‍රියා කරන මෙන් ලිඛිත ඉල්ලීම් ද ඉදිරිපත් කර ඇතත් සුදුසු නිලධාරියෙකු පත් කර නොමැති බව කාරුණිකව දන්වමි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 330 ක් තත්‍ය සේවක සංඛ්‍යාව 232 ක් වූයෙන් පුරප්පාඩු 98 ක් පැවතුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06ක් ඊට ඇතුළත් වී තිබුණි.	දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවයේ පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ PACIS මෘදුකාංගය හරහා යාවත්කාලීන කර ඇත. තවද ඇතැම් දෙපාර්තමේන්තුගත තනතුරුවල පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රමවේද අනුගමනය කිරීමට යාමේදී සිදුවන ප්‍රමාදයන් නිසා පුරප්පාඩු පිරවීමට කල්ගතව ඇත. එසේම ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MMI/5/7/Com – Vol I හා 2021.09.21 දිනැති ලිපිය මගින් 2021.09.01 දින සිට නැවත දැනුම් දෙනතුරු නව බඳවාගැනීම් තාවකාලිකව නතර කර ඇත.	පවතින කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතුය.

04
පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය, කෙටි වීඩියෝ පට නිෂ්පාදනය, සාකච්ඡාමය වැඩ සටහන්, ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය	-	-	58%
මාධ්‍ය ආවරණ	105.9%	-	-
අන්තර්ජාලය සඳහා සජීවී පටිගත කිරීමේ වැඩසටහන්	6450%	-	-
කැබිනට් මාධ්‍ය හමුව, සංඥා භාෂා නිෂ්පාදන, දමිළ භාෂා වැඩසටහන් නිෂ්පාදනය	256%	-	-
මාධ්‍ය නිවේදන හා නිල ප්‍රකාශ මාධ්‍ය වෙත නිකුත් කිරීම	-	75%	-
විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රචාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම	-	75%	-
කැබිනට් තීරණ දැනුම්දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම	95%	-	-
රජයේ විශේෂිත වැඩසටහන් පිළිබඳව ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය සහ සංවර්ධන ප්‍රවෘත්ති නිකුත් කිරීම	-	75%	-
වෙනත් ආයතනයන්හි පවත්වන ප්‍රවෘත්ති සාකච්ඡා සම්බන්ධීකරණය	-	75%	-

රජයේ නිල මාධ්‍ය නිවේදන මාධ්‍ය වෙත නිකුත් කිරීම	100%	-	-
සංවර්ධන වැඩසටහන් සම්බන්ධ මාධ්‍ය නිරීක්ෂණ වාරිකා සංවිධානය කිරීම	-	-	50%
මාධ්‍ය ආවරණ සම්බන්ධීකරණය කිරීම	100%	-	-
දිස්ත්‍රික් මට්ටමින් ප්‍රවෘත්ති නිකුත් කිරීම	100%	-	-
විශේෂාංග ලිපි නිකුත් කිරීම	100%	-	-
දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මඟින් මාධ්‍ය වාරිකා සංවිධානය කිරීම	-	-	23%
දුරකථන නාමාවලි සකස් කිරීම	-	-	0%
විශේෂිත අවස්ථාවලදී වාර්තා චිත්‍රපට දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මඟින් ප්‍රදර්ශනය කිරීම	-	-	0%
ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාම ලේඛන යාවත්කාලීන කිරීම	100%	-	-
ප්‍රාදේශීය ප්‍රවෘත්ති ෆේස්බුක් පිටුව වෙත ඇතුළත් කිරීම	100%	-	-
මාධ්‍ය ඒකක නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	-	-	40%
ප්‍රාදේශීය ජනමාධ්‍ය වැඩමුළු	-	-	0%
දිස්ත්‍රික් මාධ්‍ය ඒකක නිලධාරීන් උදෙසා වාර්ෂික අභිප්‍රේරණ වැඩමුළුව	100%	-	-
ජාතික මාධ්‍ය සංකථන සඟරාව කලාප දෙකක් සය මාසිකව මුද්‍රණය කිරීම	-	-	50%
දෛනික මාධ්‍ය වාර්තාව (රූපවාහිනී රාත්‍රී පුවත් සහ අන්තර්ජාල සමාජ මාධ්‍ය පුවත් සහ දිනපතා පුවත්පත් ඇසුරින්) පිළියෙළ කිරීම	100%	-	-

විශ්වවිද්‍යාල සමඟ පර්යේෂණ පසු විපරම	-	75%	-
ජනමාධ්‍ය පර්යේෂණ අංශය දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල ජනමාධ්‍ය අධ්‍යයන අංශ සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම	-	75%	-
මාධ්‍ය හා සන්නිවේදන විෂය හදාරණ (සිංහල මාධ්‍ය) පාසල් සිසුන්ගේ සන්නිවේදනය හා මාධ්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමේ අරමුණින් Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන දේශන මාලාව	100%	-	-
පාසල් මාධ්‍ය සමාජ සඳහා බිත්ති පුවත්පත් ලබා දීම	100%	-	-
පාසල් මාධ්‍ය සමාජවල සිසු දරුවන්ගේ මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා සන්නිවේදන පොත් කට්ටලයක් ලබා දීම	-	75%	-
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග සඳහා මාධ්‍ය හා සන්නිවේදන විෂයට පෙනී සිටින පාසල් සිසුන් වෙනුවෙන් සම්මන්ත්‍රණ සංවිධානය කිරීම	100%	-	-
අතිගරු ජනාධිපතිතුමාගේ දෙවර්ෂ පූර්ණය වෙනුවෙන් ‘‘ජනපති ආලෝචන’’ සමරු ග්‍රන්ථය මුද්‍රණය කිරීම	100%	-	-
මාධ්‍ය හා සන්නිවේදන විෂය උගන්වන පාසල් ගුරුවරුන් වෙනුවෙන් හැඳුනුම්පත් ලබා දීම	100%	-	-
පාසල් මාධ්‍ය සමාජ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර, සහතිකපත් ලබා දීම	100%	-	-
පාසල් මාධ්‍ය සාක්ෂරතාව දියුණු කිරීම සහ නූතන ජනමාධ්‍ය භාවිතයේ ප්‍රවනතා පිළිබඳව	100%	-	-

පාසල් සිසුන් සඳහා යූ-ටියුබ් නාක්ෂණය ඔස්සේ ජනමාධ්‍ය විෂය අධ්‍යාපනය ලබා දීම			
පාසල් මාධ්‍ය සාක්ෂරතාව දියුණු කිරීම සහ නූතන ජනමාධ්‍ය භාවිතයේ ප්‍රවනතා පිළිබඳව පාසල් සිසුන් සඳහා ෆේස්බුක්, යූ-ටියුබ් පිටුවක් පවත්වාගෙන යාම	100%	-	-
ඡායාරූප සංරක්ෂණාගාරයේ ඇති පැරණි දල සේයාපට පිරික්සීම	-	-	74%
පිරික්සන ලද ඡායාරූප සංරක්ෂණය (ඡායාරූප සංරක්ෂණාගාරය)	-	89%	-
සියලු ඡායාරූප සංරක්ෂණය සඳහා ඩිජිටල් සංරක්ෂණාගාරය වෙත ලබා දීම	-	89%	-
දේශීය හා විදේශීය රාජතාන්ත්‍රිකයින්ගේ පැමිණීම, විශේෂ අවස්ථා හා රාජ්‍ය උත්සව සඳහා ඡායාරූප ඇල්බම සැකසීම	-	-	74%
ඡායාරූප ප්‍රදර්ශන සංවිධානය	-	-	-
රට තුළ විවිධ ස්ථානවල සිදු වූ විශේෂ සිදුවීම් හා සංවර්ධන කටයුතු ආවරණය කිරීම	-	-	74%
දෙසතිය පුවත් සඟරාව ප්‍රකාශයට පත් කිරීම	-	75%	-
සමාජ මාධ්‍ය face book Reach ඉහළ නැංවීම	100%	-	-
Twitter, You Tube, Instagram Reach ඉහළ නැංවීම	-	75%	-
රජයේ ඩිජිටල් මාධ්‍ය වැඩමුළු 2ක් පැවැත්වීම	100%	-	-
Face Book boosting කිරීම	90%	-	-
මාධ්‍ය හැඳුනුම්පත් මුද්‍රණය	100%	-	-

විශේෂ අවශ්‍යතා සඳහා හැඳුනුම්පත් මුද්‍රණය	100%	-	-
කාර්යාල හැඳුනුම්පත් මුද්‍රණය	100%	-	-
පාර්ලිමේන්තු සැසිවාර ආවරණ කිරීමේ අරමුණින් පාර්ලිමේන්තු සජීවී විකාශය	100%	-	-
අමාත්‍ය මණ්ඩල මාධ්‍ය ආවරණය සහ අමාත්‍යාංශ සංවර්ධන පුවත් මාධ්‍ය ආවරණය කිරීම සහ සජීවී විකාශය	90%	-	-
මොබිටෙල් හා ඩයලොග් ජංගම දුරකථන ජාලා හරහා දැනට ක්‍රියාත්මක වන කෙටි පුවත් සේවය මඟින් ප්‍රවෘත්ති ලබා දීම අනෙකුත් දුරකථන සේවා දක්වා ව්‍යාප්ත කිරීම	-	70%	-
රජයේ නිල You Tube අඩවිය මඟින් කෙටි පුවත් වීඩියෝ, Info News සංවර්ධන වැඩසටහන් සහ කෙටි චිත්‍රපට වීඩියෝ ප්‍රචාරය කිරීම	-	75%	-

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය, කෙටි වීඩියෝ පට නිෂ්පාදනය, සාකච්ඡාමය වැඩ සටහන්, ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය	115	67	-	58%	-
මාධ්‍ය ආවරණ	720	763	-	-	105.9%
අන්තර්ජාලය සඳහා සජීවී පටිගත කිරීමේ වැඩසටහන්	04	258	-	-	6450%
කැබිනට් මාධ්‍ය හමුව, සංඥා භාෂා නිෂ්පාදන, දමිළ භාෂා වැඩසටහන් නිෂ්පාදනය	48	123	-	-	256%
Network Cabling at the DGI	To fill the gap of Network	කැබිනට් අනුමැතිය ලැබී ඇත. (2022 ජනවාරි 19)	-	50%	-
මාධ්‍ය නිවේදන හා නිල ප්‍රකාශ මාධ්‍ය වෙත නිකුත් කිරීම	ප්‍රචාරක අංශය වෙත පැවරී ඇති මෙම රාජකාරී	2021 වර්ෂයේදී රට මුහුණ දුන්	-	-	75%

විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රචාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම	100%ක් ප්‍රසස්ථ අයුරින් ඉටු කිරීම	කොවිඩ් තත්වය හමුවේ 100%ක් නොවූවත් සමස්ථයක් ලෙස 85%කින් මෙම අරමුණු ඉටු කර ගැනීමට හැකි විය	-	-	75%
කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම			-	-	95%
රජයේ විශේෂිත වැඩසටහන් පිළිබඳව ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය සහ සංවර්ධන ප්‍රවෘත්ති නිකුත් කිරීම			-	-	75%
වෙනත් ආයතනයන්හි පවත්වන ප්‍රවෘත්ති සාකච්ඡා සම්බන්ධීකරණය			-	-	75%
රජයේ නිල මාධ්‍ය නිවේදන, මාධ්‍ය වෙත නිකුත් කිරීම			-	-	100%
සංවර්ධන වැඩසටහන් සම්බන්ධ මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම			-	50%	-
මාධ්‍ය ආවරණ සම්බන්ධීකරණය කිරීම			-	-	100%
ඓතිහාසික වටිනාකමක් ඇති දළ සේයා පටල (Negatives) ඩිජිටල් බවට පරිවර්තනය කිරීම හා ඩිජිටල් පුස්තකාලයට භාර දීම	-	-	-	50%	-
රජයේ ප්‍රකාශන අලෙවි කිරීම	රජයේ පනත්, ගැසට්, හැන්සාඩ් අලෙවිය හා	මිලියන 5.078 (වාර්ෂික)	-	-	75%

	අවශ්‍යතාව මත ප්‍රදර්ශන කුටි පැවැත්වීම				
නිවැරදි තොරතුරු කඩිනමින් ජනතාව වෙත සන්නිවේදනය	රජයේ තිරසර සංවර්ධන තොරතුරු විශ්වසනීයව, පුළුල් ලෙස සන්නිවේදනය	සමාජ මාධ්‍ය Face Book, Twitter, You Tube, Instagram, Reach සංඛ්‍යාව ඉහළ යාම	-	-	100%
සමාජ මාධ්‍ය පුහුණු වැඩමුළු පැවැත්වීම	නිසි පුහුණුව ඔස්සේ මෙම කාර්යයන් පිළිබඳ දැනුම හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම	රජයේ ඩිජිටල් මාධ්‍ය වැඩමුළු 2ක් පැවැත්වීම	-	-	100%
රජයේ සමාජ මාධ්‍ය ඔස්සේ වැඩි පිරිසකගේ අවධානය යොමුවන පරිදි ප්‍රවෘත්ති සන්නිවේදනය	දෙපාර්තමේන්තුවේ මාධ්‍ය වේදිකාව පිළිබඳව වැඩි පිරිසකගේ අවධානය යොමු කිරීම හා දැනුවත් කිරීම	Face Book boosting කිරීම	-	-	90%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුළුල් අවබෝධයක් ලබා දීම වෙනුවෙන් You tube හා Face book යන සමාජ ජාලා භාවිතා කිරීම ආරම්භ කරන ලදී.

එසේම ආයතන පරිශ්‍රයේ මෙතෙක් කලක් අපිළිවෙළට සකසා තිබූ Data & Voice Cable ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ලවා පිළිසකර කරන ලදි. ජංගම ජනමාධ්‍යවේදී මධ්‍යස්ථානය (Mobile Journalism Center / Mojo Project) ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 100ක් අනුමතව ඇත. එය විශේෂ ජයග්‍රහණයකි. එසේම ජනමාධ්‍යවේදී හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා එක්ව නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම 2021 වසරේ සිට ආරම්භ කිරීමට හැකි වීම ප්‍රධාන ජයග්‍රහණයකි. එම දත්ත පද්ධතිය හරහා පහසුවෙන් දත්ත ගබඩා කිරීම සහ එම දත්ත ලබා ගැනීමේ හැකියාව ඇත. එය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට උපයෝගී වී ඇත.

අභියෝග :

පවතින තරහකාරී වටපිටාව තුළ සමාජ මාධ්‍ය තුළින් ජනතාවට නිවැරදි හා විශ්වසනීය තොරතුරු ඉක්මණින් ලබා දීම සඳහා පවතින මානව හා ප්‍රාග්ධන සම්පත්වල හිඟය යම් අවස්ථාවන්වලදී ගැටළු පැන නැගීමට හේතු වී ඇත.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / ~~(අතිරික්ත)~~ **
ජ්‍යෙෂ්ඨ	17	11	06
තෘතීයික	16	02	14
ද්විතියික	244	177	67
ප්‍රාථමික	53	42	11

06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

තෘතීයික මට්ටමේ සහ ද්විතියික මට්ටමේ මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා සෘජුවම බලපා ඇත. විශේෂයෙන් තාක්ෂණික කාර්යභාරය ඉටු කරන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෛනික රාජකාරී කටයුතු ඉටු කර ගැනීමේදී අපහසුතාවයක් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ යෙදී සිටි දැනුම සහ කුසලතාවයෙන් යුතු නිලධාරීන් විශ්‍රාම යාම ප්‍රධානම හේතුව වී ඇත. නවක නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට විශාල කාලයක් ගත වනු ඇත. එසේම එම තනතුරුවල පුරප්පාඩු සඳහා උසස්වීම් ලබා දීමට ඇති බාධා හේතුවෙන් ද මේවන විට විවිධ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරී හිඟයක් ඇති වී තිබේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (RS'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය රු.	විදේශීය රු.		
පුහුණු පාඨමාලා	22	2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාල සීමාව තුළ	839,000/-	-	දේශීය	ඒ, ඒ විෂයයන්ට අදාළව විෂය දැනුමක් ලබා ගැනීම
පුහුණු වැඩමුළු	-	-	-	-	විදේශීය	-

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

රාජ්‍ය සේවයට නවක පත්වීම් ලද නිලධාරීන් අනුයුක්ත කර සිටින අංශවලට හා පවරනු ලබන රාජකාරීවලට අදාළව බාහිර ආයතන මඟින් නිසි පුහුණුවක් ලබා දීම තුළින් තම රාජකාරී නිවැරදිව, ක්‍රමානුකූලව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇත. එසේම කාර්ය මණ්ඩල අභිප්‍රේරණයක් ළඟා කර ගැනීම මෙමඟින් අපේක්ෂිතය. නව දැනුම උකහා ගැනීමට හා දැනුම යාවත්කාලීන කර ගැනීමට අවස්ථාව සලසා දීම මඟින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට විශාල පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

එසේම විද්‍යශීය පුහුණු සඳහා නිලධාරීන් යොමු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය යටතේ පවතින කටයුතු ඩිජිටල්කරණය කිරීම විධිමත් කිරීමට හැකියාව ලැබී ඇත. එනම්, පැරණි චිත්‍රපට, වාර්තා චිත්‍රපට සංරක්ෂණය කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීම ආරම්භ වී ඇති අතර අනාගතයේදී මහජනතාවට / මාධ්‍යවේදීන්ට හෝ අවශ්‍ය වෙනත් කෙනෙකුට අවශ්‍ය අවස්ථාවන්වලදී පරිහරණය කිරීමට හෝ දැක බලා ගැනීමට අවස්ථාව ලබා දීමට අපේක්ෂිතය.

2021 වර්ෂයේ රටෙහි පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වැඩි කාලයක්, නිලධාරීන් බොහෝ පිරිසක් නිවසේ සිට රාජකාරී ඉටු කරන ලද අතර, වෙනත් ආයතන වෙත හෝ විදේශීය පුහුණුව සඳහා නිලධාරීන් යැවීමේ ප්‍රායෝගික අපහසුතා පැවතීම හේතුවෙන් දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සමස්ථයක් ලෙස අඩපණ විය.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රා.ගි.ව.අංක 271/2019 (මූල්‍ය ප්‍රකාශන - 2019) මඟින් තවදුරටත් එම ලේඛන පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය නොවන බව දන්වා ඇත	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-

3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම්	අනුකූල වේ	-	-

	දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	කොවිඩ් - 19 වසංගතය නිසා සියලු සේවකයින් සේවයට නොපැමිණීම	ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කරනු ලැබේ
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	කොවිඩ් - 19 වසංගතය නිසා සියලු නිලධාරීන් සේවයට නොපැමිණීම හේතුවෙන්	ඉදිරියේදී නියමිත පරිදි කටයුතු සිදු කරනු ලැබේ
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	-	-

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කොවිඩ් - 19 වසංගතය නිසා සියලු සේවකයින් සේවයට නොපැමිණීම හේතුවෙන්	ඉදිරියේදී නියමිත පරිදි පවත්වනු ලැබේ
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල්	අනුකූල වේ	-	-

	කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මේ සඳහා වන ක්‍රියාවලියට දිගු කාලයක් ගත වීම	භාවිතයෙන් ඉවත් කරනු ලබන වාහන නිවැරදිව හඳුනාගෙන අදාළ කටයුතු කඩිනමින් ඉටු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	සිදු වී ඇති, එහෙත් මේ වන විට පරීක්ෂණ පවත්වා නොමැති සියළුම වාහන අනතුරුවල පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	රටේ පැවති වාතාවරණය මත නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වීම	නියමිත දිනට පිළියෙල කිරීම
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම්	අනුකූල නොවේ	රටේ පැවති වාතාවරණය මත	මු.රෙ.ප්‍රකාරව කටයුතු කිරීම

	කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම		මු.රෙ.ප්‍රකාරව ක්‍රියා කිරීමට නොහැකි වීම	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල නොවේ	රජයේ අත්‍යවශ්‍ය ප්‍රචාරන කටයුතු සිදු කිරීමට සිදු වීම හේතුවෙන් සමහර වැය විෂයයන් සඳහා ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු විය. නමුත් සමස්ථ ප්‍රතිපාදන සීමාව ඉක්මවා නොමැත	වර්ෂ අවසාන ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීමට කටයුතු කිරීම
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිපති උපදෙස් ඉල්ලා ඇති අතර, නීතිපති උපදෙස් ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ	ඉදිරියේදී නිසි කලට ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	මාධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අදාළ ගැටළු මේ දක්වා විසඳී නොමැත	රඳවා ගැනීම් මු.රෙ.ප්‍රකාරව නිදහස් කිරීමට කටයුතු කිරීම
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	රටේ පැවති වාතාවරණය මත අදාළ කාර්යයන් නිම වී මාසයක් ඇතුළත නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල්	මු.රෙ.371 ප්‍රකාරව කටයුතු කිරීම

			කිරීමට නොහැකි වීම	
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල නොවේ	දැනට පාලන හා ගිණුම් අංශවල නිලධාරීන්ට පමණක් ලබා දී ඇති අතර, ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ සියලුම	

			අංශවල නිලධාරීන්ට ලබා දීමට කටයුතු කරමින් පවතී	
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන්	අනුකූල වේ	-	-

	මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරනු ලැබේ	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සකස් කිරීමට බලාපොරොත්තු වේ	
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අදාළ නොවේ	-	-

අවසානය :

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වන අතර වෙනස්වන ගෝලීය තාක්ෂණ ප්‍රවනතාවන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකී කාර්යභාරය සාක්ෂාත් කරගනු වස් එනම්, යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම ලාංකේය සමාජය තුළ ස්ථාපිත කිරීමට උපයෝගි කර ගනු ලබන ප්‍රතිපත්ති සැකසීම, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පාලනය, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ රාජකාරීමය සම්බන්ධතා පවත්වාගෙන යාම ආදිය සඳහා දෙපාර්තමේන්තුව සිය කාර්යමණ්ඩලය මෙහෙයවන අතර එහිදී එකී නිලධාරීන්ට සිය වගකීම් ඉටු කර ගැනීමට අවශ්‍ය කරන දැනුම, හැකියාව හා පරිසරය සකස් කර දෙනු ලබයි.

මේ තුළ වැඩි අවධානයක් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු කෙරෙහි යොමු කෙරෙන අතර දෙපාර්තමේන්තුවේ සියලුම අංශ එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිසම ක්‍රියාත්මක වේ.

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාව මෙන්ම ඒ හා ඇදුනු තවත් අරමුණු සාක්ෂාත් කර ගනු වස් ක්‍රියාත්මක රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ඒ වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම් සිය සැලසුම් තුළ අන්තර්ගත කර වසර මුලදී එකී සැලසුම් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගනී.

ඉන් අනතුරුව වසර පුරා එකී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වන අතර එමඟින් සාක්ෂාත් කර ගැනීමට වෙර දරන අරමුණු මූලික වශයෙන් පහත පරිදි පෙළගැස්විය හැක.

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් වැඩපිළිවෙල පිළිබඳව තොරතුරු මහජනතාව වෙත ගෙන යාම
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම
- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම

ඉහත අරමුණු සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වර්ග කළ හැක.

- අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් (මාධ්‍යවේදීන්, පාසල් සිසුන්, මාධ්‍ය ලේකම්වරුන් හා අනෙකුත් පාර්ශව)
- මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම (කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාව හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන කාර්යභාරයට අදාළව)
- ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම
- මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම
- සංවර්ධන වැඩසටහන් පිළිබඳ ලිපි හා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම
- නව මාධ්‍ය යොදාගෙන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම (Face Book, You Tube, Twitter etc….)
- දෙස් - විදෙස් මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාළ අංශ දැනුවත් කිරීම
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම
- වාර්තා චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රචාරය
- ජාතික උත්සව හා සංරක්ෂණය කළ යුතු අවස්ථාවන් ආවරණය හා එකී අවස්ථා ඡායාරූප ගැනීම හා සංරක්ෂණය

මෙලෙස විවිධාකාර භූමිකා හා අරමුණු ඔස්සේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තම දෛනික රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂමතාවයෙන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ඉටු කර ගැනීමට මනා පිටුබලයක් වෙමින් ඉදිරි වර්ෂය සඳහා ද ක්‍රියාත්මක වනු ඇත.



රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්, පොල්හේන්ගොඩ, කොළඹ 05.

அரசாங்க தகவல் திணைக்களம்
இல.163, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05.

Department of Government Information
No.163, Kirulapone Avenue, Polhengoda, Colombo 05

w w w . d i g . g o v . l k w w w . n e w s . l k